# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2018 සැප්තැම්බර් මස 18 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණසිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

1. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.09.04 වන දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/VI/(1)/18/49)

අ. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හදාරන ගුරුවරුන්ට ඒ සඳහා වන පාඨමාලා ගාස්තු වලින් අඩක් ගෙවීමට පළාත් සභාව මීට පෙර ගෙන තිබූ ක්‍රියාමාර්ගය නවතා තිබේද?යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ආ. එසේ නොමැතිනම් සමහර අධ්‍යාපන කලාප වල ගුරුවරුන් සඳහා එම දීමනාව නොගෙවන බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඇ. විශේෂයෙන් පිළියන්දල අධ්‍යාපන කලාපයේ මෙම ගෙවීම 2006 වසරේ සිට නවතා තිබෙන්නේ කුමන පදනමක් මතද,යන්න ඔබතුමා දන්වන්නෙහිද?

ඈ. කාර්යක්ෂම සේවයක් උදෙසා ගෙවනු ලබන මෙම මුදල් ලබා දීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?යන්න සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේනම් ඒ මන්ද?

2. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.09.04 වන දින අසන ලද ප්‍රශ්නය;

(ප්‍ර/VI/(1)/18/50)

අ. ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක, සභානායක, විපක්ෂ නායක, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයන් ලෙස මන්ත්‍රීවරයකුට අමතරව ලබා දී ඇති ඒ ඒ ධුරයන්ට අනුව වරප්‍රසාදයන් හා පහසුකම් මොනවාද?

ආ. එම ධුරයන්හි වරප්‍රසාදයන් හා පහසුකම් වෙනුවෙන් මාසිකව වැය කරන්නා වූ මුදල ධුරයන්ට අදාලව වෙන වෙනම සඳහන් කරන්නේද?

ඇ. එම ධුරයන්ට පැවරී ඇති කාර්යභාරයන් කවරේද?

- සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න,

3. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.09.04 වන දින සභාව කල් තබන අවස්ථාවේ දී අසන ලද ප්‍රශ්නය;

(ප්‍ර/VI/(1)/18/ADG-05)

අ. බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිල්ලේ සභා ශාලාවට සභාපතිතුමාගේ පිවිසුම සිදු වන දොරටුවේ ප්‍රධාන ද්වාරය සඳහා වැය වූ සම්පූර්ණ මුදල කීයද?

ආ. එම ද්වාරය වෙනුවෙන් වෙනම ඇස්තමේන්තුවක් තිබේ ද? එහි මුදල කීයද?

ඇ. එම ද්වාරය සකස් කිරීමට ලබා දුන්නේ ටෙන්ඩර් පටිපාටියකට අනුවද?

ඈ. ඒ අනුව ද්වාරය සකස් කිරීමට ඉල්ලුම් කළ ආයතන කවරේද? කුමන මිල ගණන් ඉදිරිපත් කළේද?

ඉ. ද්වාරය තැනූ ආයතනය කුමක්ද?

4. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI/(1)/18/54)

අ. වසරක් ධාවනයෙන් ඉවත් වූ බස් රථවල මාර්ග බලපත්‍රය නැවතත් ප්‍රවාහන අධිකාරිය වෙත ලබා ගත යුතු බව ඔබතුමා දන්නේ ද?

ආ. එවැනි හඳුනාගත් බස්රථ කොපමණ ප්‍රමාණයක් වර්ෂ 2017 සහ මෙම වසරේ දැනට තිබේද?යන්න සභාගත කරන්නේද?

ඇ. ඉහත සඳහන් හඳුනාගත් ප්‍රමාණයන් මාර්ගයෙන් මාර්ගයට අදාළ වර්ගීකරණයක්, ලේඛණයක් ලෙස සභාගත කළ හැකි ද?

ඈ. එසේ හඳුනාගත් බලපත්‍ර සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය කුමක්ද?

ඉ. එම ක්‍රියා පටිපාටියෙන් බැහැරව මාර්ග බලපත්‍ර විකුණා ඇත්නම් ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කරනු ලබන්නේ ද?

5. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/VI/(1)/18/55)

අ. බස්නාහිර පළාතේ සංවර්ධන වැඩසටහන - 2017 යටතේ ව්‍යාපෘති අංක **H-78431164003** මගින් නවගම්පුර, එච්/29/ඒ/1 යන ලිපිනයෙහි මිගෙල් ආරච්චිගේ චිත්‍ර මංගලිකා යන තැනැත්තියහට රුපියල් විසිදහස (රු.20,000/-) ක නිවාස ආධාර මුදලක් අනුමත කොට තිබූ බව ඔබතුමා පිළිගන්නේද?

ආ. උක්ත ආධාර මුදල අනුමත වූ ලේඛන සභාගත කළ හැකිද?

ඇ. මංගලිකා මහත්මිය උක්ත මුදල සඳහා ද්‍රව්‍යාධාර ලබා ගැනීමට කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගිය අවස්ථාවේ දී එම ආධාර මුදල අනුමත කර නොමැති බව පවසා එම මුදල ලබා දී නොමැති බව ඔබතුමා පිළිගන්නේද?

ඈ. කෙසේ වුවද උක්ත ව්‍යාපෘති අංකය යටතේ ද්‍රව්‍යාධාර කිසියම් කෙනෙකු විසින් ලබා ගෙන තිබේද?

ඉ. එසේ ලබා ගෙන තිබේනම් ඒ සඳහා පූර්ණ පරීක්ෂණයක් ඔබතුමා විසින් පවත්වනු ලබන්නේද?

6. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/VI/(1)/18/56)

අ. අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ "කත්තොට ඉඩම" නමැති අක්කර 4 ½ ක භූමි භාගයකින් යුතු ඉඩම කොටස් කර විකිණීම සඳහා 2012.04.11 වන දින පිඹුරු අංක **6473G/2012** පිඹුර අනුමත කිරීම සඳහා එවකට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් කොන්දේසි 8 ක් දමා ඇති බවත්, එම කොන්දේසි සපුරන්නේ නම් අදාළ අයට ඉඩම කට්ටි කිරීම සඳහා අනුමැතිය ලබා දෙන බව ඔහු විසින් ලිඛිතව දන්වා ඇති බව ඔබතුමා දන්නෙහිද?

ආ. එකී ඉඩම මේ වන විට අදාළ කොන්දේසි කිසිවක් ඉටු නොකර කට්ටි කර විකුණා ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඇ. අදාල ඉඩම කට්ටි කර විකිණීම සඳහා 2014 වර්ෂයේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් කටයුතු කරන ලද්දේ කුමන පදනමක් මතද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ඈ. කිසිදු කොන්දේසියක් ඉටු නොකර එකී ඉඩම කොටස් කර විකිණීම සම්බන්ධයෙන් අදාල සභාපතිවරයාට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

7. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ඉ/VI/(1)/18/57)

අ. බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කොළඹ 01 කාර්යාලයේ පරිපාලන නිලධාරී ධාවන බී.එන්.එස්. කරුණාචන්ද්‍ර මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ විගණන අංශයෙන් 2018.08.07 වන දින කරන ලද පරීක්ෂණයන් සම්බන්ධයෙන් ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කොපමණ කාලයක් ගත වෙන්නේද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ආ. එකී නිලධාරිවරයාට එරෙහිව විගණන අංශයෙන් ලබා දුන් නිර්දේශ 08 සම්බන්ධයෙන් ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද යන්න සභාවට දන්වන්නෙහිද?

ඇ. එසේ එකී නිලධාරිවරයාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ඔහුට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

ඈ. නොඑසේ නම් ඒ මන්ද?

8. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ඉ/VI/(1)/18/58)

අ. බස්නාහිර පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත කළමනාකරණ චක්‍ර ලේඛන අනුව 2012.05.01 සිට මේ දක්වා කොපමණ සේවක සංඛ්‍යාවක් බඳවාගෙන තිබේද?යන්න සභාවට දන්වන්නෙහිද?

ආ. එකී චක්‍ර ලේඛනයට පිටින් කොපමණ සේවක සංඛ්‍යාවක් බඳවාගෙන තිබේද යන්න ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

ඇ. එකී චක්‍ර ලේඛනයට පිටින් බඳවාගනු ලැබූ සේවකයින් සඳහා උසස්වීම් ලබා දී ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඈ. චක්‍ර ලේඛනයට පිටින් සේවකයින් බඳවා ගැනීම සඳහා කටයුතු කරන ලද අයට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

9. ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/VI/(1)/18/59)

අ. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත කාපට් ඇතිරීමේ යන්ත්‍ර පසුගිය කාලයේ ලබා දී ඇති බව ඔබතුමා දන්නේද?

ආ. එම යන්ත්‍ර සූත්‍ර ලබා දුන් පළාත් පාලන ආයතන මොනවාද?

ඇ. ඒ සඳහා වැය වී ඇති මුළු මුදල කොපමණද?

ඈ. එම මුදල් වැය කරනු ලැබුයේ කිනම් අමාත්‍යාංශයක අරමුදල් මඟින් ද යන්න මෙම ගරු සභාවට පැහැදිලි කරන්නේද?

ඉ. කඩුවෙල මහ නගර සභාවට ලබා දී ඇති මෙම යන්ත්‍ර වල වත්මන් තත්ත්වය කුමක්ද?

ඊ. මෙම අසාර්ථක ව්‍යාපෘතිය හරහා මුදල් අවභාවිතාවක් සිදුව ඇති බව ඔබතුමා පිළිගන්නේද?

10. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/VI/(1)/18/60)

අ. බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පාලනය වන රෝහල්තුල ක්‍රියාත්මක මට්ටමේ තිබෙන එක්ස්රේ යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර, ECG යන්ත්‍ර හා එන්ඩස්කොපි යන්ත්‍ර ප්‍රමාණය කොපමණද?

ආ. බස්නාහිර පළාත් තුල රෝහල් වල මෙම යන්ත්‍ර තිබෙන යන්ත්‍ර තිබෙන ප්‍රමාණය දිස්ත්‍රික් මට්ටමින් වෙන වෙනම කොපමණද?

ඇ. ඉහත යන්ත්‍ර ලබා දී දැනට අක්‍රිය මට්ටමේ තිබෙන යන්ත්‍ර ප්‍රමාණය කොපමණද?

ඈ. එය දිස්ත්‍රික් මට්ටමෙන් කොපමණද?

ඉ. ඉහත යන්ත්‍ර ලබා දීමට සුදුසු එහෙත් ලබා නොදුන් රෝහල් ප්‍රමාණය කොපමණද?

11. ගරු නාන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,-

(ඉ/VI/(1)/18/61)

අ. බස්නාහිර පළාත තුල බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් පාලනය වන මුළු රෝහල් සංඛ්‍යාව කොපමණද?

ආ. ඉන් මූලික රෝහල් සංඛ්‍යාව කොපමණද?

ඇ. දිසා රෝහල් සංඛ්‍යාව කොපමණද?

ඈ. ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව කොපමණද?

ඉ. පර්යන්ත රෝහල් සංඛ්‍යාව කොපමණද?

ඊ. මධ්‍ය බෙහෙත් ශාලා කොපමණද?

උ. මෙම රෝහල් දිස්ත්‍රික්ක මට්ටමින් වෙන වෙනම කොපමණද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ / වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා:

"බ්ලූමැන්ඩල් කුණු කන්ද, මීතොටමුල්ල කුණු කන්ද, කරදියාන කුණු කන්ද, වැනි කුණු කඳු කඩා වැටී මනුෂ්‍ය ජීවිතත්, සමස්ත පරිසරයත් ව්‍යසනයට පත් වෙද්දී ඒවාට වග කියන බලධාරීන්, ආයතන, ඒවා වැළැක්වීමටත් ඒවාට ස්ථිර සාර විසඳුම් යොදන බවත්, කියමින් නොයෙකුත් පුරසාරම් දොඩන ලදී. මීතොටමුල්ල කුණු කන්දත්, බ්ලූ මැන්ඩල් කුණු කන්දත් නාගරික උද්‍යාන බවට පත් කරන බවට ප්‍රකාශ කරන ලදී. තවමත් එම කුණු කඳු එසේම පවතී. දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් නොමැත. කැළණි ගඟ වසරක් පාසා පිටාර ගලද්දී ඒවාට යට වන ජනතාවට එම අවස්ථාවේ දී බත් පැකට්ටුවක්, වියළි ආහාර ටිකක් බෙදා දී තාවකාලිකව සමනය කරනු ඇත. මෙම සියළු ව්‍යසනයන්ට. ඒ ඒ විෂයන් අයත් අමාත්‍යාංශ මැදිහත්ව දීර්ඝකාලීන විසඳුම් ඉදිරිපත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි."

(යෝ/ VI/(1)/18/04)

## 02. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා :

"බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප මට්ටමින් පිහිටුවනු ලැබ ඇති විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඉගෙනුම ලබන පාසල් සංඛ්‍යාව 182 ක් පමණ වන අතර, එම පාසල් වල ඉගෙනුම ලබන විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සංඛ්‍යාව 3713 කි.

රජයේ පාසල් වල ඉගෙනුම ලබන සාමාන්‍ය දරුවන්හට 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ශිෂ්‍ය ආධාර මුදලක්ද, විශ්ව විද්‍යාල සිසුන්හට මහපොළ ශිෂ්‍යත්වය මගින් ශිෂ්‍ය ආධාර මුදලක්ද, ලබා දීමේ ක්‍රමයක් පැවතිය ද, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්හට ශිෂ්‍ය ආධාර මුදලක් ලබා දීමේ ක්‍රමවේදයක් නොමැත.

බස්නාහිර පළාතේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දෙන පාසල් වල ඉගෙනුම ලබන දරුවන් දිරි ගැන්වීම සඳහා එම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් යම් දීමනාවක්, ආධාර මුදලක් ලබා දිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි."

(යෝ/ VI/(1)/18/05)

### XI. සභාව කල් තැබීම.

2018.09.05 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.